**මධ්‍යම සංස්කෘතික අරමුදල - 2020**
**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 වියාචනය කළ මතය**

මධ්‍යම සංස්කෘතික අරමුදලේ (අරමුදල) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය වියාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව, අස්ථිත්වයේ සේවක ප්‍රතිලාභ බැදීම ගණනය කිරීමේදී ආයුගණන ක්‍රමය යොදාගත යුතු වුවත් 2020 දෙසැම්බර් 31 දිනට රු. 730,392,632 ක් වූ පාරිතෝෂික සඳහා වෙන්කිරීම ගණනයේදී ආයුගණන ක්‍රමය භාවිතා කර නොතිබුණි. | 2024 වර්ෂයේ දී ආයුගණන ක්‍රමය යොදාගනිමින් සේවක ප්‍රතිලාභ ගණනය කිරීම සිදු කල අතර 2022 වර්ෂයේ සිට බලපාන පරිදි ගිණුම්වල ගැලපීම් කිරීම සිදු කල බව දන්වා තිබුණි. | ප්‍රමිතියේ නියමයන්ට අනුකූලව ගණනය කිරීම් සිදුකල යුතුවීම. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 ඡේදය ප්‍රකාරව, ජංගම වත්කම් හා ජංගම වගකීම් හිලව් කල නොහැකි වුවත් සමාලෝචිත වර්ෂයේ දී එක් පුද්ගලයකුට අයත් රු.2,442,405 ක්වූ ණයගැති ශේෂයක් එම පුද්ගලයාගේ රු. 413,109 ක් වූ ණයහිමි ශේෂයකට හිලව් කිරීමෙන් පසු ණයගැති ශේෂය රු.2,029,296 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි. | ණයගැති ශේෂ සඳහා ණයහිමි ශේෂ හිලව් කිරීමේ ගිණුම්කරන වරද 2025 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ප්‍රමිතියේ නියමයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුවීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය සඳහා ලැබිය යුතු පොළිය ගිණුම්ගත නොකිරීම නිසා ලැබිය යුතු පොළී ගිණුම රු.916,438 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මේ වන විට ලැබියයුතු පොළිය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කර ඇති බව දන්වා තිබුණි. | වර්ෂයට අදාල ආදායම නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | 2018 හා 2019 වර්ෂයන්ගේ විගණන ගාස්තු රු.504,450ක ඌන වෙන් කිරීමක් සිදු කර තිබීම සමාලෝචිත වර්ෂයේදී ද ගැලපීම් කර නොතිබුණි. | පරීක්ෂාකර බලා වර්තමාන ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ස්ථාවර තැන්පතු වල විගණනය විසින් සිදු කල ගණනය කිරීම අනුව සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු පොලී ආදායම රු 487,445,757 ක් වුවද රු.488,449,366 ක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගෙන තිබීම හේතුවෙන් වර්ෂයේ පොලී ආදායම රු.1,003,609 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2020 වර්ෂයේ රුපියල් හා ඩොලර් ස්ථාවර තැන්පතු වලට අදාල පොලි ආදායම වැඩියෙන් ගණනය කර ගිණුම්ගත කර තිබීමේ වරද තවදුරටත් පරීක්ෂා කර බලා වර්තමාන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වර්ෂයට අදාල ආදායම් වටිනාකම නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කලමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ජංගම නොවන වගකීම් යටතේ වූ විශේෂ අරමුදල් ව්‍යාපෘති 10 ශේෂය | 8,786,148 | උපලේඛන , පොත්පත් හා ලිපි ගොනු | 2021 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම තොරතුරු හෙළිදරව් කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | පොත්පත්, ලිපිගොනු, උපලේඛණ විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |
| | විදේශ අරමුදල් ව්‍යාපෘති 05 ශේෂය | 4,757,900 | | | |
| (ආ) | ආයෝජන ආදායම | 545,988,781 | ස්ථාවර තැන්පතු ලේඛන , ස්ථාවර තැන්පතු සහතික, අලුත්කිරීමේ නිවේදන , ලැබිය යුතු පොලී ආදායමට අදාල උපලේඛන | බැංකු ශේෂ සනාථන ද සෘජුවම විගණන අංශය වෙත යොමුකරන ලෙස බැංකුව වෙත උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි . | අදාල ලිඛිත සනාථන විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |
| | ලැබිය යුතු රුපියල් ස්ථාවර තැන්පතු පොලී | 346,753,011 | | | |
| | ලැබිය යුතු ඩොලර් ස්ථාවර තැන්පතු පොලී වටිනාකම | 34,789,220 | | | |
| (ඇ) | කෙරීගෙන යන වැඩ | 176,008,737 | ඇස්තමේන්තුගත මුදල, සහතික කරන ලද වැඩ වටිනාකම, එක් එක් වර්ෂයන්හිදී කෙරීගෙන යන වැඩ ගිණුමට ගිණුම්ගත කල ප්‍රමාණය ඇතුලත් උපලේඛන | එක් එක් කාර්යය සඳහා වූ ඇස්තමේන්තු ගත මුදල, සහතික කරන ලද වැඩ වටිනාකම කොපමණද හා එක් එක් කාර්යයට අදාළව වර්ෂයේදී කෙරීගෙන යන වැඩ ගිණුමට ගිණුම්ගත කරන ලද ප්‍රමාණය කොපමනද යනාදී ලෙස විස්තරාත්මකව තොරතුරු ඇතුලත් කර සකස් කරන ලද වාර්තාවක් දැනට පිළියෙල කර නොමැති අතර එය කඩිනමින් පිළියෙල කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | විස්තරාත්මක උප ලේඛණ විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ඈ) | අවසන් තොග ශේෂය | 150,200,943 | තොග ලේඛන , තොග අගය කිරීමේ පත්‍රිකා, තොග සමීක්ෂණ වාර්තා | 2020.12.31 දිනට පවතින තොග ශේෂයට අදාළ සාරාංශගත වාර්තාවක් 2020 අවසන් ගිණුම් වාර්තාවේ පිටු අංක 23 හි සඳහන් කර ඇති බව දන්වා තිබුණි. | ශේෂය තහවුරු කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඉ) | මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ශේෂය | 25,169,515 | ගෙවිය යුතු ශේෂයක් බවට තහවුරු කර ගැනීමට අදාල තොරතුරු | 2013 වසරේ සිට පැවත එන ශේෂයක් වේ. මේ සම්බන්ධ සවිස්තරාත්මක තොරතුරුද සොයා ගැනීමට අපහසුව ඇති බැවින් ඒ සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීමට අභ්‍යන්තර විගණන අංශයට භාරදීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ගෙවිය යුතු ශේෂයක් බවට තහවුරු කර ගැනීමට අදාල තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ඊ) | ස්ථාවර වත්කම්<br>විලම්භිත අයභාරය | 21,000,000<br>1,050,000 | විලම්භිත අයභාරයට අදාල ස්ථාවර වත්කම් උපලේඛනය | විලම්භිත අයභාරයට අදාළව පිළියෙල කරන ලද ලේඛනයක් උපලේඛන පොතෙහි පිටු අංක 43-48 යටතේ ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි. | විලම්භිත අයභාරයට අදාල ගොඩනැගිලි මොනවාද යන්න දැක්වෙන අයුරින් උප ලේඛණ ඉදිරිපත් කල යුතුය. |
| (උ) | කොන්ත්‍රාත් රැඳවුම්<br>ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු<br>ටිකට් පත් විකුණුම් අත්තිකාරම් | 12,594,892<br>9,205,208<br>52,881,696 | උපලේඛන | විස්තරාත්මක උපලේඛන ඉදිරි වර්ෂවල සිට ගිණුම් සමග ලබාදීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | කොන්ත්‍රාත් රැඳවුම් වටිනාකමෙහි නිවැරදිතාවය සනාථ කිරීමට අදාල කොන්ත්‍රාත් ගිවිසුම් සහ ගෙවීම් සහතික කොන්දේසි යනාදිය ඇතුලත් වන පරිදි වූ විස්තරාත්මක උප ලේඛණ සහ අනෙකුත් තැන්පතු වලට අදාල උප ලේඛණ විගණනයට ඉදිරිපත් කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඖ) | වෙනත් ආදායම් යටතේ දක්වා ඇති කුලී ආදායම<br><br>වෙනත් ආදායම් | 10,052,991<br><br>1,347,086 | ආදායම් ලේඛන , උපලේඛන | අනුරාධපුර, පොළොන්නරුව, කතරගම යන ප්‍රදේශයන්හී ඇති සංචාරක බංගලා කුලියටදීමෙන් උපයන ලද ආදායමත්, එවකට මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ තිබූ අපේගම පරිශ්‍රය තුළ ඇති ශාලා කුලියටදීමෙන් උපයන ලද ආදායම සහ ආයතනයේ නිළධාරීන්ගේ වැටුපෙන් නිළ නිවාස වෙනුවෙන් වටිනාකම් ඇතුළත් වූ ආදායමයි. මේ සඳහා අදාළ පොදු ලෙජර ගිණුමේ පිටපතක් මේ සමඟ අමුණා ඇති බව දන්වා තිබුණි. | විගණනය වෙත ප්‍රමාණවත් වන පරිදි උපලේඛන ඉදිරිපත් කල යුතුය. |
| (එ) | ස්ථාවර තැන්පතු ආයෝජන | 6,465,740, 201 | ස්ථාවර තැන්පතු ලේඛන ස්ථාවර , තැන්පතු මුල් පිටපත | බැංකු ශේෂ සනාථනද සෘජුවම විගණන අංශය වෙත යොමුකරන ලෙස බැංකුව වෙත උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි. | වටිනාකම තහවුරු කිරීමට අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |
| (ඒ) | ටිකට් පත් ආදායම් වලින් අඩුකර දක්වා තිබූ බෝනස් ටිකට් ආදායම<br>නැවත මුදල් ආපසු ගෙවූ ටිකට් පත් ආදායම | 6,099,730<br><br>667,674 | ටිකට් පත්වල සංකේත අංක ඇතුලත් විස්තරාත්මක උපලේඛන | 2020 වර්ෂයට අදාළව නිකුත් කර ඇති බෝනස් ටිකට්පත් ප්‍රමාණයට අදාළ සාරාංශයක් අවසන් ගිණුම්හී පිටු අංක 32 හි දක්වා ඇති බව දන්වා තිබුණි. | විස්තරාත්මක උපලේඛන විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂය තුළ අඩමාන ණය වෙන්කිරීම් ශේෂය | 3,396,573 | ගණනය කල ආකාරයට අදාල තොරතුරු | 2012 වසරේ සිට වෙන් කරන ලද අඩමාණ ශේෂයන් මෙම ශේෂය තුළ අන්තර්ගතව ඇත. ඒ අනුව මෙම ශේෂයන් නිශ්චිතව හඳුනා ගැනීමට ප්‍රමාණවත් තොරතුරු සොයා ගැනීමට අපහසුව ඇති අතර, ඒ පිළිබඳ තවදුරටත් පරීක්ෂාකර බලා අදාළ ගිණුම්කරණ නිවැරදි කිරීම් ඉදිරියේදී සිදු කිරීමට උත්සහා කරන බව දන්වා තිබුණි. | අඩමාන ණය ගණනය කිරීමට අදාල තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඕ) | විවිධ ණය ගැති ශේෂය | 2,029,296 | ණයගැති ලේඛනය, විස්තරාත්මක උපලේඛන | මෙම ශේෂයට අදාළව විස්තරාත්මක උපලේඛනයක් සකස් කිරීමට ප්‍රමාණවත් තොරතුරු සොයා ගැනීමට අපහසුව පවතී. මෙම ශේෂය තුළ 2010 වර්ෂයට පෙර සිට පැවත එන ණයගැති ශේෂයන් පවතින අතර, එම තොරතුරු අන්තර්ගත ලිපිගොනු වර්තමානයේ සොයා ගැනීමට අපහසු බව දන්වා තිබුණි. | ශේෂය සනාථ කිරීමට අදාල ලිඛිත සනාථන ඉදිරිපත් කල යුතුය. |
| (ක) | දිගු කාලීන ලැබිය යුතු ශේෂ යටතේ දක්වා ඇති වර්ෂ 04ක සිට පැවත එන Challengerlanka ගිණුමේ ශේෂය හා Court deposit ශේෂය | 1,382,054<br>44,533 | විස්තරාත්මක උපලේඛන | Court Deposits ලෙස දක්වා ඇති ශේෂය ඉතා පැරණි ශේෂයක් වන අතර, ඒ සම්බන්ධයෙන් සවිස්තරාත්මක තොරතුරු වර්තමානයේදී සොයා ගැනීමට අපහසුව ඇති බව දන්වා තිබුණි. | ශේෂයන් සනාථ කිරීමට අදාල ලිඛිත සනාථන විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ග) | ජංගම වගකීම් යටතේ ගෙවිය යුතු ශේෂ ලෙස දක්වා ඇති අවලංගු චෙක්පත් වටිනාකම<br>ඉදිකිරීම් ආයතන සඳහා ගෙවිය යුතු වටිනාකම | 224,700<br>75,296,799 | උපලේඛන | අවලංගු චෙක්පත් සම්බන්ධයෙන් වන රු.224,700 සම්බන්ධයෙන් පරීක්ෂාකර බැලීමට කටයුතු කරනු ලැබේ. ඉදිකිරීම් ආයතන සඳහා ගෙවියයුතු ශේෂයන් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කොන්ත්‍රාත් ලේඛනය සහ ඒවාට අදාළ ලිපිගොණු විගණනය වෙත අවශ්‍යනම් ඉදිරිපත් කිරීමට හැකි බව දන්වා තිබුණි. | විගණනය වෙත ප්‍රමාණවත් වන පරිදි උපලේඛන ඉදිරිපත් කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල යටතේ පවතින ව්‍යාපෘතීන් මඟින් සිදුකරනු ලබන කාර්යයන් ක්‍රියාවට නැංවීම සඳහා අරමුදලේ නිලධාරින් බාහිර පාර්ශවයන් හා කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදී තිබූ අත්තිකාරම් අතරින් 2020 දෙසැම්බර් 31 දිනට | රු.546,307,765 ක මුදලින් රු.436,267,817 ක මුදලක් ගෙවනු ලැබ ඇත්තේ 2019 වසරේ ආරම්භ කරන ලද සිසුදහම් සෙවණ ව්‍යාපෘතිය යටතේ දහම්පාසැල් සහ | නොපියවූ අත්තිකාරම් පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |

| | |
|---|---|
| නොපියවූ අත්තිකාරම් රු. 546,307,765 ක් විය. ඉන් රු. 16,237,849 ක් වසර 5 ක් ඉක්මවා තිබූ අතර මෙම ශේෂ නිරවුල්කර ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණු අතර මෙම ශේෂයන්ගේ වත්මන් තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | වෙහෙර විහාර සංරක්ෂණය කිරීම වෙනුවෙන් වන අතර, මින් කොටසක් වර්තමානය වනවිට පියවා ගැනීමටද කටයුතු කර ඇත. වසර 05 ඉක්මවූ ණය ශේෂ පිළිබඳ පරීක්ෂාකර බලා එම අත්තිකාරම් මුදල් පියවීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග හැකි ඉක්මනින් ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 316 | මුදල්, මුද්දර, ප්‍රවේශපත්‍ර වැනි මූල්‍යමය වටිනාකමක් සහිත අයිතම ඒ වෙනුවෙන් විශේෂිතව සම්පාදනය කොට ඇති සුරක්ෂිතාගාරයක, සේප්පුවක, ආරක්ෂිත කාමරයක හෝ වෙනත් ආරක්ෂිත ස්ථානයක සුරක්ෂිතව තැබිය යුතු වුවත්, මුද්‍රණාලය තුල මුද්‍රිත කටයුතු අවසානයේ තාවකාලිකව ගබඩා කර තිබෙන මුද්‍රිත ප්‍රවේශපත්‍ර සහ අරමුදලේ ප්‍රධාන ගබඩාවේ තැන්පත් කර ඇති මුද්‍රිත ප්‍රවේශපත්‍ර සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලයේ ප්‍රමාණවත් පහසුකම් නොමැතිවීම නිසා මුද්‍රිත ප්‍රවේශපත්‍ර ප්‍රධාන කාර්යාලීය ගබඩාව තුලම ආරක්ෂිතව තැන්පත් කර ඇත. ඉදිරියේදී ප්‍රධාන කාර්යාලය ඉඩකඩ සහිත ස්ථානයක් බවට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලබන බැවින් එහිදී ප්‍රධාන කාර්යාලීය ගබඩාව සඳහා වඩාත් සුරක්ෂිත ස්ථානයක් ලබා ගැනීමට කටයුතු සිදුකරනු ලබන අතර, මුද්‍රිත ප්‍රවේශපත්‍ර වඩාත් සුරක්ෂිතව ගබඩා කිරීමට අවශ්‍ය ඉඩපහසුකම් සලසාගැනීමට මෙහිදී කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | මූල්‍යමය වටිනාකමක් සහිත දෑ මුදල් රෙගුලාසි ප්‍රකාරව ආරක්ෂිතව ගබඩා කල යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 227,868,487 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාව රු. 126,746,674 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 101,121,813 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ටිකට් පත් ආදායම, අනුරූ අලෙවිය ,ප්‍රකාශන ආදායම සහ මුද්‍රණ ආදායම පිළිවෙලින් රු. 2,487,833,071,රු. 6,518,074, රු. 1,658,574 සහ රු.5,737,164 කින් කින් අඩුවීමද , මූල්‍ය වියදම සහ පාරිතෝෂික වියදම පිළිවෙලින් රු.19,897,272 ක් සහ රු.56,636,505 කින් වැඩිවීම ද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දුර්වල පාෂාණයකින් නිමවා තිබුණු අව්වැසි වලට නිරාවරණය වීම නිසා භෞතික හා රසායනික ජීරණයට ලක්ව බෙහෙවින් දුර්වල තත්වයකට පත්ව තිබූ බුදුරුවයාය සැතපෙන පිළිම වහන්සේ සඳහා පියස්සක් ඉදිකිරීමට ප්‍රමුඛ අවධානය යොමු කරන ලෙස දන්වා සංස්කෘතික අමාත්‍යාංශය විසින් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත උපදෙස් ලබා දී තිබුණි. එයට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් අනුමැතියෙන් පසුව 2019 නොවැම්බර් 04 දින බුදුරුවයාය සැතපෙන පිළිම වහන්සේ සඳහා පියස්සක් ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පසු ලිඛිත ගිවිසුමකින් තොරව රු.1,941,433 ක වටිනාකමකට දින 150 ක් තුළ සම්පූර්ණ කිරීමට ඉදිකිරීම් ආයතනයට පිරිනමා තිබුණි. විගණිත දිනය වූ 2025 අප්‍රේල් 21 දින වන විටත් රු. 874,019 ක වටිනාකමක බිල්පත් ඉදිරිපත් වි තිබුණද ගෙවීම් සිදු කර නොතිබීම මත ඉදි කිරීම් කටයුතු ඇණහිට ඇති මෙම ව්‍යාපෘතිය වසර $5\frac{1}{2}$ ක කාලයක් ගත වී ඇතත් එම ඉදි කිරීම නිම කිරීමට පියවර ගෙන නොතිබුණි. තවද, මේ සඳහා 2024 වැඩ සැලැස්ම මඟින් රු. 4,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2024 දෙසැම්බර් 31 දින දක්වා අදාල කාර්යය නිම කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථම වැඩබිමේ කාර්යයන් ඉදිරිපත් කර ඇත. එහෙත් ගිවිසුම අත්සන් කිරීම වැඩිදුරටත් ප්‍රමාද විම නිසා මෙහි සඳහන් ගෙවීම් කිරීමට නොහැකි වී ඇත. එහෙත් මෙම කාර්යයන් ඉටු කිරීමට මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් නැවත යෝජනා සකස් කර ඇත.<br>මෙම පිළිමයේ හායනය වලක්වා ගැනීම සඳහා මෙම වහළය ඉදිකිරීම සිදු විය යුතු බැවින් මේ සම්බන්ධව ඉදිකිරීම් සම්බන්ධ ආයතනයෙන් (ICTAD) උපදෙස් ලබා ගත් අතර එම උපදෙස් ප්‍රකාරව නව ගිවිසුමක් අත්සන් කිරීමට වත්මන් අධ්‍යක්ෂ ජනරාල්ට බලය ලබා ගැනීමට පාලක මණ්ඩල පත්‍රිකාවක් සකස් කර ඇත. එම ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව පැරණි කොන්ත්‍රාත්තුව අනුව ඉටුකල කාර්යයන් සඳහා ගෙවීම් කර කොන්ත්‍රාත්තුව අවසන් කර නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන ඉටු කිරීමට පාලක මණ්ඩලයේ අනුමැතියට පාලක මණ්ඩල පත්‍රිකාවක් සකස් කර ඇත. ඒ අනුව, මෙම ගැටලු විසදාගෙන පැරණි ගෙවීම කිරීමෙන් අනතුරුව මෙම කාර්යය සිදු කිරීමට අපේක්ෂා කරන බව දන්වා තිබුණි. | පවතින ගැටළු ප්‍රමාදයකින් තොරව විසඳාගෙන අදාල කාර්ය නිම කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී දළදා මාලිගාව ආසන්නයේ පිහිටි අරමුදලට අයත් ජාත්‍යන්තර තොරතුරු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්ගේ අංක PS/DSP/RAV/01/10/KP හා 2017 ජුලි 14 දිනැති ඉල්ලීම පරිදි 2017 ජුලි 23 සිට 2017 අගෝස්තු 16 දක්වා කාලය සඳහා මහනුවර ශ්‍රී පත්තිනි දේවාලයේ අවශ්‍යතා සඳහා භාර දි තිබුණි. එම ගොඩනැගිල්ල ආපසු අරමුදලට භාර ගැනීමට 2025 දෙසැම්බර් 31 දක්වාත් පියවර ගෙන නොතිබීම හේතුවෙන් මධ්‍යස්ථානය වෙතින් ලබා දුන් දේශීය හා විදේශීය සංචාරකයින් වෙත නොමිලේ තොරතුරු ලබා දීම, නොමිලේ ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් පැවැත් විම, සංස්කෘතිය හා බැදුනු පොත් හා අනුරූ අලෙවි කිරීම, ශ්‍රී ලාංකීය | මේ දක්වා අවස්ථා ගණනාවකදීම වාචිකව මෙන්ම ලිඛිතව ඉල්ලීම් කළද පත්තිනි දේවාලය මඟින් මෙම ගොඩනැගිල්ල අපවෙත නිදහස් කර දී නොමැත. ගෘහ භාණ්ඩ ආදියද මෙම ගොඩනැගිල්ල සමඟ අඟුළු ලා පත්තිනි දේවාලය මඟින් බලහත්කාරයෙන් රඳවාගෙන ඇත. එබැවින්, මෙම ගොඩනැගිල්ල හරහා සිදු වූ සමාජ මෙහෙවර ඉටු කිරීමට නොහැකි වි ඇත. 2025 මැයි 17 වන දින පාලක මණ්ඩල සාකච්ඡාවේදී පුළුල්ව සාකච්ඡා කරන ලදි. එහිදි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා මේ සඳහා මැදිහත් වී මෙම ගොඩනැගිල්ල පවරාගෙන මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත පවරා දීමට | ගොඩනැගිල්ල නිදහස් කරවාගෙන අදාල සමාජ මෙහෙවර ඉටු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංස්කෘතිය සහ උරුමය හා බැඳුණු අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම යන සේවා වසර 07 ක කාලයක් තිස්සේ ලබා දීමට නොහැකි වී තිබුණි. තවද තොරතුරු මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පවතින රු.මිලියන 05 කට අධික අරමුදලේ වත්කම් ද නිෂ්කාර්යව හා ඌණ උපයෝජිතව පැවැතිණි. | එකඟතාවය පලකර ඇත. ඒ අනුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තු වෙත මේ සම්බන්ධයෙන් ලිඛිතව ඉල්ලීමක්ද යොමු කර ඇති බව දන්වා තිබුණි. | |
| (ඇ) | නෙල්ලිගල බෞද්ධ මධ්‍යස්ථානයේ විශ්‍රාම ශාලාව ඉදිකිරීම මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් ද්‍රව්‍ය සඳහා රු.43,942,030ක් වැයකර සහ ශ්‍රී ලංකා යුධ හමුදාවේ ශ්‍රමය ලබා ගනිමින් 2019 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. විශ්‍රාම ශාලාවේ ඉදිකිරීම් කටයුතුවල සියයට 40 ක ප්‍රගතියක් මත 2020 වර්ෂයේ ඉදිකිරීම් අතරමග නවතා දමා තිබුණු අතර විගණිත දිනය වූ 2025 පෙබරවාරි 06 දින වන විටත් වසර 05 කට ආසන්න කාලයක් ගතවී තිබුනද, එම විශ්‍රාම ශාලාවේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් ව්‍යුහාත්මක සැකිල්ල සඳහා යොදා ඇති කම්බි වැසි ජලයට නිරාවරණය වීම මත මලබැඳීමට ලක් වීමෙන් ගොඩනැගිල්ලේ සවිමත්භාවය සම්බන්ධයෙන් අවදානමක් පැවැතිමත්, එහි ඉදිරි ඉදිකිරීම් කටයුතු සිදු කිරිමේදි එම තත්ත්වයන් වෙනුවෙන් අමතර පිරිවැයක් දැරීමට සිදුවන බව විගණනයේ දී නිරීක්ෂණය කෙරේ. | මහනුවර ව්‍යාපෘතිය මඟින් අදාල බෞද්ධ මධ්‍යස්ථානයේ ඉදිකරීම් කටයුතු 2020 වර්ෂයේ දී ද්‍රව්‍ය සපයාදීම සඳහා ප්‍රධාන කාර්යාලයෙන් ගන්නා ප්‍රතිපත්තිමය තීරණය වන ශ්‍රී ලංකා යුධ හමුදා හා නාවික හමුදා ශ්‍රම බලකාය මගින් පළමු මහල කොන්ක්‍රීට් තට්ටුව තෙක් ඉදිකිරීම් කටයුතු කරන ලදී. ආයතනයේ මූල්‍ය තත්ත්වය පහළ වැටීම හේතුවෙන් පාලක මණ්ඩලය තීරණයකරන ලද්දේ ආයතයේ පැවැත්ම වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ සියළුම ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා දමන ලෙසයි. ඒ අනුව එහි කටයුතු ද නවතා දැමීමට සිදු විය. ඉදිකිරීම් නවතා දැමූ පසු ගොඩනැගිලලේ වාතයට නිරාවරණය වූ කම්බි කොටස සඳහා මල නිවාරණ තීන්ත ආලේප කර ආරක්ෂා කිරීමට අදාල ආයතනය කටයුතු කර ඇත. මේ දක්වා සිදු කර ඇති ඉදිකිරීම් වල ව්‍යුහාත්මක ස්ථාවර බවට ගැටළුවක් ඇති නොවන බව දන්වා තිබුණි. | තාවකාලිකව නවතාදමා තිබූ ව්‍යාපෘති සම්බන්ධයෙන් කුමන පියවරක් ගත යුතුද සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් නොපමාව තීරණයක් ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 15 ඡේදය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2) (ඇ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුල අරමුදලට අදාල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් වර්ෂ 04 යි මාස 6කට ආසන්න කාල ප්‍රමාදයකින් පසුව 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2025 ජුලි 07 දින ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | 2018 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම ප්‍රමාද විම හේතුවෙන් දිගින් දිගටම ප්‍රමාදයන් වූ බව දන්වා තිබුණි. | අදාල චක්‍රලේඛ උපදෙස් පරිදි ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඉක්ම වීමට මත්තෙන් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කල යුතුය. |

**4.2** වාර්ෂික **කායර්සාධන** වාර්තාව පාර්ලිමේන්තුවේ **සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 15 ඡේදය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2) (ඉ) ප්‍රකාරව විගණකාධිපති වාර්තාවද ඇතුළත් කරමින් වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් (2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව දින 180 ක්) ගත වීමට පෙර සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු වුවත් 2018,2019 වර්ෂ වලට අදාල වාර්තා 2025 දෙසැම්බර් 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2017 කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අමාත්‍යාංශය වෙත යවා ඇත. 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමැතිය සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත යවා ඇත. 2019 වර්ෂයේ අවසන් ගිණුම්වලට අනුමැතිය ලබාගැනීමට ප්‍රමාදවීම හේතුවෙන් වාර්තාව ඉදිරිපත් කිරීමට ප්‍රමාද වී ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කල යුතු වේ. |